**පළාත් පාලන සේවා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල-2013**

-----------------------------------------------------------------------------

පළාත් පාලන සේවා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලේ 2013 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ,1974 අංක 16 දරන පළාත් පාලන සේවා පනතේ 23 වගන්තිය යටතේ පනවන ලද 1985 පළාත් පාලන සේවා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලේ නියෝග අංක 06 සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

**------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

**--------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලැසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 අහිතකර මතය සඳහා පදනම**

**-------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලට ගැලපීම් කර තිබුණේනම් අනුගාමී මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බොහොමයක් මූලිකාංගවලට ප්‍රමාණාත්මක ලෙස බලපෑ හැකිව තිබුණි.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 අහිතකර මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත්බව හේතුවෙන් 2013 දෙසැම්බර් 31 දිනට පළාත් පාලන සේවා වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ගිණුම්කරන අඩුපාඩු

(අ) සමාලෝචිත වර්ෂයේ සමස්ථ විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා දායකත්වය රු. 41,700,000 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණ ද විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු පරිගණක දත්ත පද්ධතියේ වියදම් වර්ගීකරණයට අනුව සමාලෝචිත වර්ෂයේ අරමුදලේ සමස්ථ විශ්‍රාම වැටුප් වියදම රු.634,964,421 ක් වුයෙන් රු.593,264,421 ක විශ්‍රාම වැටුප් වියදම අඩුවෙන් ගිණුම් ගතකර තිබුණි.

(ආ) 1999 වර්ෂයට පෙර සිට ඉදිරියට ගෙන එමින් පවතින රු.3,417,942 ක් අගරු වු චෙක්පත් ගිණුමේ ශේෂය නිරවුල් කිරීම සඳහා මෙතෙක් කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

### 2.3 නීති , රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් නීති,රීති රෙගුලාසි යනාදියට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති,රීති රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1985 පළාත් පාලන සේවා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් නියෝග මාලාවේ 8 වන වගන්තිය | දායකයකු විසින් හා පළාත් පාලන ආයතන විසින් අරමුදලට ගෙවූ සියලු දායක මුදල් පිළිබඳ ලේඛන පවත්වා ගැනීම සිදුකළ යුතු වුවත් එම අවශ්‍යතාවට අනුව කටයුතු කර නොතිබුණි. |
| (ආ) 2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ් /423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය 4.1 (අ) ජේදය | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ලේඛනය පිළියෙල කර ඒ සඳහා විෂයයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

## 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා අරමුදලේ මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵලය රු.30,521,359 ක ඌනතාවයක් වූ අතර , ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.8,329,948 ක් වූයෙන් ඉකුත් වර්ෂය හා සසඳන විට මූල්‍ය ප්‍රතිඵලයේ රු.38,851,307 ක පිරිහීමක් පෙන්නුම් කෙරිණි.

## 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

ඉකුත් වර්ෂයට සාපෙක්ෂව සමාලෝචිත වර්ෂයේ විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා දායකත්වය රු.41,700,000 ක් වීම ඌණතාවයේ වර්ධනයට ප්‍රධාන වශයෙන් ඉවහල් වී තිබුණි.

## 4. අරමුදලේ ක්‍රියාකාරීත්වය

1985 අංක 10 දරන පළාත් පාලන සේවා (සංශෝධන)පනතේ 14 වගන්තියට අනුව මුල් ප්‍රඥප්තියේ 16.අ(2)(1)ලෙස ඇතුළත් වගන්තිය ප්‍රකාරව උක්ත අරමුදලේ පාලනය විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්වරයා සතු බව සඳහන්ව ඇතත් 2010 දෙසැම්බර් 13 දිනැති අංක 12/2010 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය මඟින් අරමුදලේ මාසික වැටුප් ලේඛන පිළියෙල කිරීම හා ලිපි ගොනුවල භාරකාරත්වය 2011ජනවාරි 01 දින සිට ප්‍රාදේශිය ලේකම්වරුන් වෙත විමධ්‍යගත කර තිබුණි.

## 5. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු පිළිබඳව වරින් වර විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අවධානයට යොමු කරවන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතු වේ.

(අ) ගිණුම්කරණය
(ආ) බැංකු සැසඳුම්
(ඇ) විශ්‍රාම වැටුප් ගෙවීම
(ඈ) ආයෝජන
(ඉ) දායක මුදල් පිළිබඳ ලැබීම් ලේඛන